**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 17 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 20 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 (ඇ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා කළ නිර්දේශය සමාලෝචිත වර්ෂයේදීත් නිවැරදි කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**(අ) ආදායම් ලැබීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේ දී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතු කරන ලද ශුද්ධ ආදායම රු.334,209,868 ක් වුවත් ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ එය රු.364,532,115 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ප්‍රවාහය රු.30,322,247 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නියමිත උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |

**(ආ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු.4,226,630,666 ක් වුවද ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන තුල එය ශුන්‍ය අගයක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. ඒ් හේතුවෙන්, මෙහෙයුම් ක්‍රියාකරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය ද එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | භාණ්ඩාගාර උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වේ. |

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

----------------------------

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට අක් මුදල් ගැලපුම් ගිණුම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ පැවති අගයන් හා ඊට අදාල භාණ්ඩාගාර මුද්‍රිතවල සඳහන් අගයන් අතර රු. 6,031,083 ක වෙනසක් පවතින බව දක්වා ඇතත්, ගණනය කිරීම් අනුව එම වෙනස රු.5,875,544 ක් විය. | පිළිගනිමි. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර වෙනස නිවැරදිව අක් මුදල් ගැලපුම් ගිණුමට ගැලපිය යුතු වේ. |
| (ආ) 2000-2007 වර්ෂ වලදී වී මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදුන් වී අත්තිකාරම් මුදල් නිරවුල් නොකිරීම නිසා රු.13,018,144 ක් වූ අලාභය පාඩු හා අත්හැරීම් ප්‍රකාශනයෙහි ඇතුලත් කර නොතිබුණි. | පිළිගනිමි. | අංක 2/2020 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මු.රෙ. 113 යටතේ සියළු පාඩු හා අත්හැරීම් මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුය. |
| (ඇ) ඉකුත් වර්ෂයේ අත්තිකාරම් ලැබීම්වලට අදාලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත්වල වටිනාකම හා මූල්‍ය ප්‍රකාශනවල පැවති වටිනාකම අතර වූ රු.3,071,101 ක වෙනස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද නිවැරදි කර නොතිබුණි. | පිළිතුර දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා පොත්වල පවතින වටිනාකම ඒකිනෙකට සැසඳිය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද අග්‍රිම අවශ්‍යතා සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | පිළිගනිමි. | අග්‍රිමය සැලසුම් කිරීම නිසි පරිදි සිදුකළ යුතුවේ. |

## 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු උවත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතනික සංග්‍රහයේ | | | | |
| (i) xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද | 249,869 | සේවය අතහැර ගොස් ඇති නිළධාරීන් 03 දෙනෙකුගෙන් අය වීමට ඇති රු.92,449 ක ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) xxiv පරිච්ඡේදයේ 4.4 ,4.5 හා 4.6 ඡේද | 417,530 | මියගිය නිළධාරීන් දෙදෙනකු ගෙන් අය විමට ඇති රු.417,530 ක ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මරණ පාරිතෝශිකයෙන් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පාරිතෝශිකයෙන් අය කර ගැනීමට කටයුතු කරමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) xxiv පරිච්ඡේදයේ 4.6 ඡේදය | 408,048 | වැඩ තහනමට ලක් වී ඇති නිළධාරියෙකුගෙන් වර්ෂ 10 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.408,048 ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ නිලධාරියාට එරෙහිව නඩු පැවරීමට කටයුතු කරමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 2018 මාර්තු 19 දිනැති අංක 1/2018 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | - | ධාවනය කල නොහැකි තත්ත්වයේ පවතින වාහන අපහරණය කිරීමට කටයුතු යොදන ලෙස උපදෙස් ලබාදී තිබුණද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ධාවනයෙන් ඉවත්කරන ලද මෝටර් වාහන 08 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වැලි ව්‍යාපෘතියකින් දිස්ත්‍රික් සංවර්ධන අරමුදලට ලබා දී ඇති රු.70,662,336 ක මුදලක් පිබිදෙමු පොලොන්නරුව ව්‍යාපෘතිය වෙත පවරාගෙන වියදම් දරා තිබුණි. මේ සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයාගේ හා ආරක්ෂක අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් විසින් ලිඛිත උපදෙස් ලබා දී තිබුණි. | පිබිදෙමු පොලොන්නරුව ව්‍යාපෘතියේ නාමය පමණක් මේ සඳහා භාවිතා කර ඇති අතර අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක සියලු වැඩසටහන් සඳහා සම්බන්ධීකරණ ලේකම්වරුන්ගේ උපදෙස් සැලකිල්ලට භාජනය කරන ලද බව දන්වා ඇත. | මු.රෙ. 200 අනුව රජයේ මුදල් වැය කිරීම සඳහා ප්‍රමාණවත් අධිකාරි බලයක් තිබිය යුතු වේ. |
| (ආ) | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් විසින් සී/ස පොළොන්නරුව දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන් ගේ සමූපකාර සමිතිය වෙත 2019 මාර්තු 26 දින සිට 2019 අගෝස්තු 06 දින දක්වා අංක 118-02-03-48-1409 දරන වැය විෂයය යටතේ වී මිලදී ගැනීම සඳහා රු.මිලියන 206 ක ණය මුදලක් ලබා දී තිබුණි. එහෙත් එම මුදලින් රු.මිලියන 66.5 ක් මෙතෙක් ආපසු ගෙවා නොතිබුණු අතර, රු.මිලියන 139.5 ක් ප්‍රමාදවී අයකරගෙන තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව මාස 06 ක් ගතවීමට ප්‍රථම ගෙවා නිමකරන ලෙස ලිඛිතව වරින් වර අදාල පාර්ශව දැනුවත් කර ඇත. | රජයට අයත් මුදල් අදාල පාර්ශවයන් වෙතින් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.209,500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා මහල් 04 කින් යුත් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යය ක්‍රියාකාරි සැලැස්ම තුල හඳුනාගෙන නොතිබුණි. | පිළිගනිමි. | සුදුසු පරිදි ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කළ යුතු වේ. |
| (ආ) | ක්‍රියාකාරි සැලැස්ම තුල ඇතුලත් නොවූ රු.5,810,000ක් වටිනා ක්‍රියාකාරකම් 04 ක් වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබුණි. | පිළිගනිමි. | -එම- |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016/2017 වර්ෂවල රු.500,000 ක ප්‍රතිපාදන වැය කර ව්‍යාපෘති 4 ක් යටතේ ඉදිකර තිබූ ගොඩනැගිලි අංග සම්පූර්ණ නොවී පැවතීම නිසා වසර 3-4 දක්වා කාලයක් භාවිතයට ගත නොහැකි මට්ටමක පැවතුණි. | ඉතිරි වැඩ ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන අනුව නිම කිරීමට බලාපොරොත්තු වේ. | ඉදිකිරීම් කටයුතු නිම කිරීමට සැලසුම් කළ යුතු වේ. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැලිකන්ද නව ගම්මානවල කොටසේ මාර්ග මෝටර් ග්‍රේඩර් කර කානු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතිය රු.495,000 ක මුදලකට මහුල්පොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය වෙත පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව එම ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් 18 දින වන විට වැඩ අවසන් කල යුතුව පැවතුණ ද 2021 පෙබරවාරි 16 දින වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | 2020 ජූලි 29 දින වැඩ අවසන් කර ඇති අතර අදාල මාර්ගය නැවත වල් බිහිවී, වර්ෂාව නිසා පැති කානු ගොඩ වී තිබූ බව දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා ප්‍රමාද කාල සීමාව සඳහා නියමිත ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කල යුතු වීම. |

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පළමු අදියර යටතේ පිහිටුවා ඇති ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර සමිති 29 න් සමිති 10 ක් අක්‍රිය බව හඳුනාගෙන තිබුණු අතර, එම අක්‍රිය සමිති සඳහා ජීවනෝපාය සංවර්ධන, ධාරිතා සංවර්ධන හා යටිතල පහසුකම් සංවර්ධන අරමුදල් විලින් ලබාදී තිබූ රු.53,083,349 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි. | අක්‍රීය ග්‍රාම ශක්ති සමිති විසුරුවා හැර නිෂ්කාර්යව පවතින මුදල් හා වත්කම් නැවත පවරා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත දන්වා ඇත. | අක්‍රීය සමිති, ක්‍රියාකාරී සමිති මට්ටමෙන් පවත්වාගත යුතු අතර අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ සක්‍රීය සමිතිවල පලමු අදියර යටතේ ජීවනෝපාය සංවර්ධනයට, ධාරිතා සංවර්ධනයට හා යටිතල පහසුකම් සංවර්ධනයට ලබාදී තිබූ රු.8,963,712 ක් 2020 වර්ෂය තුල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මාසික ප්‍රගතිය ලබාගන්නා ලෙසත්, ක්ෂේත්‍ර පරික්ෂණ සිදුකර මුදල් ප්‍රයෝජනයට ගන්නා ලෙසත් සමිති නිලධාරීන් සඳහා නිරන්තරයෙන් උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කල යුතු අතර ඒ සම්බන්ධව පසු විපරම් කළ යුතුවේ. |
| (ඇ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ දෙවන අදියර යටතේ පිහිටුවා ඇති සමිති 26 න්, සමිති 23 ක් අක්‍රිය බව හඳුනාගෙන ඇති අතර, ජීවනෝපාය සංවර්ධන, ධාරිතා සංවර්ධන හා යටිතල පහසුකම් සංවර්ධන අරමුදල් යටතේ ලබාදී තිබූ රු.9,374,289 ක් ද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අක්‍රිය සමිති විසුරුවා හැර රජය මඟින් ලබාදුන් සියළු මුදල් හා වත්කම් නැවත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | සමිති ක්‍රියාකාරී මට්ටමෙන් පවත්වා ගැනීමට කටයුතු කල යුතු අතර, අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතු වේ. |

**3.5 ප්‍රසම්පාදනයන්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------------- | ----------- |
| (අ) | ‘‘සපිරි ගමක්’’ ප්‍රජා පාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 යටතේ මැදිරිගිරිය හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ස්වෙච්ඡා සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් පදනම මත ලබාදී තිබූ ව්‍යාපෘති 07ක් එම සමිති විසින් උප කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදී තිබුණි. | උප කොන්ත්‍රාත් ලබාදීමක් සිදුවී නොමැති බව දන්වා ඇත. | උප කොන්ත්‍රාත් ලබා දී ඇති බවට ලිඛිත සාක්ෂි මඟින් තහවුරු වේ එම නිසා 2012 ජනවාරි 05 දිනැති 01/2012 අංක දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ (iv) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2019 සපිරි ගමක් වැඩසටහන යටතේ හිඟුරක්ගොඩ ක්‍රියාත්මක වී තිබූ ඊරිගේ ඔය පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ජල සම්බන්ධතාවය ලබාදී නොතිබුණු අතර, ඒ සඳහා පාලමක් හරහා බට එලීම ජල සම්පාදන මණ්ඩලයේ අවසරය මත සිදුකල යුතු විය. එහෙත් ඒ සම්බන්ධව ජල සම්පාදන මණ්ඩලයට දන්වා නොතිබුණි. | ජල සම්පාදනය ලබා දෙන ලෙස ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලීම් කර ඇත. | ව්‍යාපෘතිය ගිවිසුම්ගත දිනට අවසන් කල යුතු අතර ප්‍රමාද වන කාල සීමව සඳහා ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කල යුතු වේ. |

(ඇ) <u>පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය</u>

| | | | |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අවම මිලට වඩා වැඩි මිලකට අයිතම මිලදී ගැනීම හේතුවෙන් මිලදී ගැනීම් අවස්ථා 07 කට අදාලව රු.1,933,005 ක වැඩි පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. | පැකේජ් ක්‍රමය සාර්ථක ක්‍රමයක් වන අතර ගුණාත්වයෙන් අඩු අවම මිල ගණන් ඉදිරිපත් කල ලංසු නියදි පරීක්ෂාවෙන් ඉවත් කරන ලදි. | ලංසු ලේඛන සඳහා කොන්දේසි ඇතුලත් කිරීමේදී අස්ථීත්වයට පිරිවැය අවාසියක් සිදු නොවන පරිදි කටයුතු කල යුතු වේ. |
| (ii) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ මින්නේරිය බස් නැවතුම්පොලේ ඉහල මහලට විදුලි සම්බන්ධතාව ලබාගැනීම සඳහා රු. 453,830 ක වියදමක් දරා තිබුණු අතර, 2021 අප්‍රේල් වන විටත් විදුලි සම්බන්ධතාවය ලබාගෙන නොතිබුණි. එසේම ඉහල මහලයේ ආපන ශාලාවේ සිදුකර ඇති ඉදිකිරීම් ප්‍රමාණයන්ට වඩා රු.472,204 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | විදුලි සම්බන්ධතාව ලබා ගැනීම ප්‍රාදේශීය සභාව විසින් ඉටු කර ගත යුතු අතර ඉහළ මහලේ පවතින දෝෂ වගකීම් කාලය අවසන් වීමට පෙර සකසා දෙන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. ගෙවූ අධි මුදල රඳවුම් මුදලින් අඩු කරන ලෙස දන්වා ඇත. | නිසි ප්‍රමිතියකින් හා අධීක්ෂණයකින් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර, අධි ගෙවීම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ රු.4,425,190 ක පිරිවැයක් දරා ඉදිකිරීමට යෝජිත ''ලක්ෂ උයන රණවිරු උද්‍යානයට'' අදාල ව්‍යාපෘතියේ රු.1,276,161 කට ඇස්තමේන්තු කර තිබූ අයිතම 11 ක් ඉටු කර නොතිබුණි. තවද භෞතිකව පැවති ඉදිකිරීම් ප්‍රමාණයන්ට වඩා රු. 347,089 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. එසේම රු. 470,611 ක වියදමක් දරා සිදුකර තිබූ ටයිටේනියම් ද ගැලවීගොස් තිබුණි. | හිටපු ජනාධිපතිතුමා සමඟ සිදු කල සාකච්ඡා වලදී ගත් තීරණ අනුව සැලසුම් වරින් වර වෙනස් කිරීමට සිදුවී ඇති අතර වැඩිපුර කල ගෙවීම් රඳවුම් මුදලින් අය කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. වගකීම් කාලය අවසන් වීමට පෙර අඩු පාඩු සකසා දෙන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. | නිසි ප්‍රමිතියකින් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර අධි ගෙවීම් රඳවුම් මුදල් මඟින් අඩු කර ගැනීමට හා අඩුපාඩු නිවැරදි කර ගැනිමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (iv) පොළොන්නරුව කෞතුකාගාරයේ උද්‍යාන අලංකරණ කටයුතු සඳහා ගෙවීම් කිරීමේ දී භෞතිකව පැවති ප්‍රමාණයන්ට වඩා රු.783,915 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | අවසන් බිල්පත් ඉදිරිපත් වී ඇති බැවින් අඩුපාඩු සකස් කර නැවත පරීක්ෂා කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ඉටුකල වැඩ කොටස සඳහා නිවැරදි ප්‍රමාණයට පමණක් ගෙවීම් කළ යුතු වේ. |
| (v) පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ රු. 30,231,506 ක වියදමක් දරා වැඩ අවසන් කර, හිගුරක්ගොඩ ප්‍රදේශීය සභාව වෙත භාර දී තිබූ ජයන්තිපුර වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ බිම් සකස් කර නොතිබීම සහ පැරණි කඩ කාමර කඩා ඉවත් නොකිරීම නිසා එම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. විදුලි සැපයීම සඳහා පිරිවැය රු. 2,381,860 ක් බවත් එම මිල ගණන් 2020 දෙසැම්බර් 31 දක්වා වලංගු වන බවත් දක්වා තිබුණි. නමුත් 2021 අප්‍රේල් 30 දින දක්වාම විදුලි සැපයීම ලබාගෙන නොතිබූ නිසා වෙළඳ සංකීර්ණය විවෘත කිරීමට නොහැකි වීමෙන් ඒ සඳහා වැය කළ මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | පිළිගනිමි. | රජයේ ප්‍රතිපාදන මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති භාවිතයට ගත හැකි තත්වයෙන් වැඩ අවසන් කළ යුතු වේ. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019/2020 මහ කන්නයේ රජයේ මැදිහත්වීම මත ක්‍රියාත්මක කළ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ තමන්කඩුව, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ, ඇලහැර හා | ගිවිසුම් ප්‍රකාරව සහල් ලබාදීමට සහල් හිමියා බැඳී සිටින බැවින් රජයට කිසිදු අවධානමක් නොමැති බව ඇලහැර ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. සහල් තොග ලබාගැනීමට කටයුතු | රජයට ලැබිය යුතු සහල් තොග කඩිනමින් ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වැලිකන්ද යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වී මෝල් හිමියන් වෙත ලබා දී තිබූ වී තොග වලින් රජයට ලබාදිය යුතු සහල් කිලෝ ග්‍රෑම් 996,223 ක් ලබාගෙන නොතිබුණි. | කරමින් පවතින බව තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | |

(ආ) <u>සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය</u>

| | | | |
|---|---|---|---|
| (i) | ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමේදී හා ගෙවීම් කිරීමේදී 2020 වර්ෂයට අනුමත ප්‍රසම්පාදන රේටයන් භාවිතා නොකර 2019 වර්ෂයට අදාල ප්‍රසම්පාදන රේටයන් යොදාගෙන තිබීම හේතුවෙන් තමන්කඩුව, ලංකාපුර, මැදිරිගිරිය හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි මාර්ග සංවර්ධන ව්‍යාපෘති 45 ක් සඳහා රු. 2,958,078 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | රැදවුම් මුදල් නිදහස් කර නොමැති බැවින් වැඩිපුර කල ගෙවීම් අය කර ගැනීමට කටයුතු කරන බව මැදිරිගිරිය, තමන්කඩුව හා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දන්වා ඇත. එකම ව්‍යාපෘතියේ විවිධ උප ව්‍යාපෘති සඳහා විවිධ රේටයන් පාදක කර ගැනීම මත විෂමතා පැන නගින බැවින් එකම රේටයක් අනුගමනය කර ඇති බව වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | නියමිත රේටයන් පදනම් කරගෙන ගෙවීම් කල යුතු අතර වැඩිපුර කළ ගෙවීම් අදාල පර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ii) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 10 දෙනෙකු සඳහා ලබා දී තිබූ එකතුව රු.656,310 ක් වූ උපකරණ හා අමුද්‍රව්‍යයන් භාවිතයට ගෙන නොතිබූ බැවින් රජය වැය කල මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | එම ප්‍රතිලාභීන් 10දෙනාට විරුද්ධව නීතිමය පියවර ගන්නා බව ලිඛිතව දැනුම් දී ඇත. | සුදුසු ප්‍රතිලාභීන් හඳුනාගෙන භාණ්ඩ නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් නිරන්තරයෙන් පසුවිපරම් කටයුතු කළ යුතු වේ. |
| (iii) | ගෙවතු වගාව කරගෙන යාම සඳහා විකල්ප බල ශක්තියක් ලෙස සූර්යය බල ශක්තිය ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තෝරාගන්නා ලද පාසල් දෙකක් විසින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ඒ් සඳහා රු.166,500 බැගින් | වෙනත් පාසලකට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉඩමෙහි වගා කටයුතු සඳහා භාවිතා කිරීමට තීරණය කර ඇත. | මිලදී ගැනීම් සිදු කිරීමට ප්‍රථම අවශ්‍යතාව සහිත ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | මිලදීගෙන තිබුණු සෝලා වතුර පොම්ප පද්ධති දෙකක් නිෂ්කාර්යව පැවතුණි. | | |
| | (iv) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෞද්ගලික හිමිකමක් ඇති ඉඩමක් රජයේ ඉඩමක් ලෙස සලකා බෙදා වෙන්කර 2000 අප්‍රේල් 26 දින ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කර තිබුණද, දිසා අධිකරණය විසින් 2017 සැප්තැම්බර් 28 දින පෞද්ගලික හිමිකරුට මෙම ඉඩම හිමි බවට තීන්දු කර තිබුණි. එම නිසා ඉඩම්ලාභීන් 8 දෙනෙකුට ඉඩම් අහිමි වී තිබුණු අතර, ඉඩම් හිමිකම පිළිබඳ නොසලකා ඉඩම් බෙදාදීම හේතුවෙන් එම ඉඩම් සංවර්ධනය කරන ලද බලපත්‍රලාභීන් අසරණ තත්ත්වයකට පත්වී තිබුණි. | වෙනත් ඉඩමක් යෝජනා කර ඒ සඳහා ගොවි මහතුන්ගේ කැමැත්ත ලැබී ඇති අතර, වන ජීවී අධ්‍යක්ෂ ජෙනරාල්ගේ එකඟතාව ලද පසු ඉඩම් කට්ටි බෙදා දීමට කටයුතු කරන බව දන්වා ඇත. | විධිමත් පරීක්ෂණයකින් තොරව පෞද්ගලික ඉඩම රජයේ ඉඩමක් ලෙස බෙදා වෙන්කල බලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගතයුතු වීම. |
| | (v) 2019 වර්ෂයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ මහුල් පොකුණ වසමේ කිරි ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ලබා දුන් රු. 229,955 ක භාණ්ඩ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමෙන් නිෂ්කාර්යව පැවතුනි. | නව ව්‍යවසායකයෙකු තෝරාගන්නා තෙක් බඩු වට්ටෝරු ලේඛනයට ඇතුලත් කර ඇති අතර සියලු භාණ්ඩ ගබඩාවේ භෞතිකව ඇති බව දන්වා ඇත. | සුදුසු ප්‍රතිලාභින් කඩිනමින් හඳුනාගෙන අදාල ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ). | තමන්කඩුව, වැලිකන්ද හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම්වල ගිණුම් වලින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සහන පියවර හා සහන අරුණළු දීමනා ගෙවීම සඳහා රු. 64,345,000 ක් වැය කර තිබූ නමුත් එම මුදල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | එම මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලීම් කර ඇතත් ප්‍රතිපූර්ණය කර නොමැති බව දන්වා ඇත. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) <u>මනම්පිටිය වැලි ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන අරමුදලට බැර කර තිබූ මුදල්.</u> | | |
| (i) 2021 පෙබරවාරි 24 වන දිනට මනම්පිටිය වැලි ව්‍යාපෘතියෙන් පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන අරමුදලට බැර කර ඇති රු.37,981,776 ක මුදලක් නිෂ්කාර්යව පැවතුනි. | මෙම අරමුදල මඟින් දරන ලද වියදම් පිළිබඳ නිරන්තරයෙන් විගණන විමසුම් වලට ලක්වී ඇති බැවින් එම මුදල් වියදම් කිරීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවල යොජනා අනුව කටයුතු කිරීමට තීරණයකර ඇති බව දන්වා ඇත. | දිස්ත්‍රික් සංවර්ධන අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු වන ආකාරයෙන් අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුවේ. |
| (ii) ඉහත අරමුදල විසින් 2018 හා 2019 වර්ෂ වලදී දිඹුලාගල හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වල අඩු ආදායම්ලාභීන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුනද ප්‍රතිලාභීන් 58 දෙනෙකු විසින් වැසිකිලි සාදා නිම නොකිරීම හේතුවෙන් රු.1,157,480 ක මුදලක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | පිළිගනිමි. | අවශ්‍යාතාව සහිත සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගැනීම කළ යුතු වේ. |
| (iii) උක්ත අරමුදලෙන් 2018 හා 2019 වර්ෂ වල ද අඩු ආදායම් ලාභීන් සඳහා අඩි 10 සෙවිලි ශීට් 16 බැගින් ලබාදී තිබූ අතර ඇලහැර, හිඟුරක්ගොඩ හා තමණ්කඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වල ප්‍රතිලාභීන් 09 දෙනෙකු විසින් රු.257,328 ක් වටිනා සෙවිලි ශීට් 144 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ශීට් සෙවිලි කර නොමැති ප්‍රතිලාභීන් ඉදිරියේ දී ශීට් සෙවිලි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අවශ්‍යාතාව සහිත ප්‍රතිලාභීන් නිවරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iv) ඉහත ව්‍යාපෘතිය යටතේ දිඹුලාගල, මැදිරිගිරිය, වැලිකන්ද, හිඟුරක්ගොඩ හා තමණ්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් බෙදාදීමට මිලදී ගෙන තිබූ රු. 330,595 ක් වටිනා සෙවිලි තහඩු 185 ක් පළුදු වී තිබූ අතර ඒ වෙනුවෙන් නව සෙවිලි ශීට් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | පළුදු වී ඇති ශීට් වෙනුවෙන් නව ශීට් ලද විගස බෙදා දීමට කටයුතු කරන බව දන්වා ඇත. | මිලදී ගැනීම සිදු කිරීමේදී නිසි ප්‍රමිතිය පිළිබඳ සැලකිලිමත් විය යුතු අතර අදාළ වෙළෙඳ ආයතන වලින් පළුදු වූ ශීට් වෙනුවෙන් නව ශීට් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

(ඉ) <u>ඉඩම් කච්චේරි පැවැත්වීම</u>

| | | | |
|---|---|---|---|
| (i) | මැදිරිගිරිය, තමන්කඩුව, ලංකාපුර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2017 - 2020 වර්ෂ තුළ පැවැත්වූ ඉඩම් කච්චේරි 62 ක් සඳහා දින 12 ත් දින 365 ත් අතර කාල ප්‍රමාදයක් සහිතව මූලික ලැයිස්තු සඳහා විරොධතා කැඳවා තිබුණි. | එම කටයුතු වහාම අවසන් කරන ලෙස උපදෙස් ලබාදී ඇති බව දන්වා ඇත. | 2018/04 හා 2018 අගෝස්තු 20 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාලගේ චක්‍රලේඛයේ 13.3 (ඊ) ඡේදය ප්‍රකාරව කටයුතු කර යුතුවේ. |
| (ii) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ කිරිඔය වසම තුළ ප්‍රතිලාභීන් සඳහා ඉඩම් කච්චේරි පවත්වා අවසර පත්‍ර 476 ක් හා ඊට අදාලව ප්‍රදාන පත්‍ර 224 ක් නිකුත් කර තිබූ අතර, පසුකාලීනව ඉඩම් හිමිකරුවන් විසින් නීත්‍යානුකූලව හා නීත්‍යානුකූල නොවන අයුරින් ඉඩම් විවිධ පුද්ගලයින් වෙත අන්සතු කර මැණික් පතල් කැණීම් සඳහා යොදාගෙන තිබුණි. | අන්සතු කර ඇති අවසර පත්‍ර අවලංගු කිරීමටත් ප්‍රදානපත්‍ර රජයට පවරා ගැනීමටත් උපදෙස් දී ඇති බව දන්වා ඇත. | අන්සතු කර ඇති අවසර පත්‍ර අවලංගු කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | 2018 සිට 2020 දක්වා කාලය තුල මධ්‍යම රජයේ ඉඩම් සඳහා මැදිරිගිරිය, තමන්කඩුව, ලංකාපුර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මැනුම් ඉල්ලීම් 2,314 ක් යවා තිබූ නමුත් ඉන් 2020 දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබුණේ මැනුම් ඉල්ලීම් 1,139 ක් පමණි. | COVID- 19 වෛරසය හේතුවෙන් ඉඩම් පරීක්ෂා කිරීමට නොහැකි බව හා ලංකාපුර හා අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මිනුම්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ප්‍රමාදය වලක්වා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | මැනුම් ඉල්ලීම් ප්‍රමාදයකින් තොරව ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (iv) | මැදිරිගිරිය හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් රාජ්‍ය ආයතන , පාසල්, පළාත් පාලන ආයතන හා විහාරස්ථාන 277 කට අදාලව පැවරුම් සහතික හා පූජා භූමි ඔප්පු ලබා දීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පැවරුම් සහතික හා පූජා භූමි ඔප්පු නිකුත් කිරීමට කටයුතු කල යුතුවේ. |

| | | |
|---|---|---|
| (v) මැදිරිගිරිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් මධ්‍යම රජයට අයත් දීමනා පත්‍ර 15 ක් වසර 01 සිට වසර 3 ½ ක් වූ කාල පරාසයක් තුල ප්‍රතිලාභීන් වෙත බෙදාදීමට කටයුතු කර නොතිබුණි. | මැතිවරණ කටයුතු හා කොවිඩ් වසංගතය හේතුවෙන් දීමනා පත්‍ර බෙදාදීමට නොහැකි වූ බව දන්වා ඇත. | දීමනා පත්‍ර ප්‍රතිලාභීන්ට කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) <u>විශ්‍රාම වැටුප් ගෙවීමේ දුර්වලතා</u> | | |
| **(i)** දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| විශ්‍රාමිකයා මියයෑමෙන් පසුව ඔහුගේ විශ්‍රාම වැටුප ඥාතිවරයෙකු විසින් අයතා ලෙස පරිහරණය කිරීම හේතුවෙන් ඔහුගෙන් තවදුරටත් රු.49,000 ක මුදලක් අය විය යුතුව පැවතුණි. එසේම යාවත්කාලීන තොරතුරු දැනුම් නොදීම සම්බන්ධයෙන් අදාල ග්‍රාම නිලධාරිවරයාට එරෙහිව ද කටයුතු කර නොතිබුණි. | ගෙවීම් කරන ලෙස සිහි කැදවීම් යවා ඇති බව දන්වා ඇත. | අදාල හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ii) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| • ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී 2008 දෙසැම්බර්23 දින මියගිය නිලධාරියකුගේ බිරිඳට සහ දැරියට ලැබිය යුතු විශ්‍රාම වැටුප හා යැපීම් දීමනා ගෙවීම ප්‍රතිලාභියා මිය ගොස් වසර 12 ක් ගත වී තිබුණද මෙතෙක් ගෙවා නොතිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් නිර්දේශයන් හා පැහැදිලි කිරීම් ලද විගස ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | විශ්‍රාම වැටුප ප්‍රමාද නොකර අදාළ ප්‍රතිලාභීන් වෙත ගෙවීමට කටයුතු කල යුතු වේ. |
| • විශ්‍රාම ලාභියකුගේ වැන්දඹු බිරිඳට ගෙවන ලද විශ්‍රාම වැටුප සහ යැපීම් දීමනාව බිරිඳ නැවත විවාහවීම හේතුවෙන් 2016 මැයි මස සිට නවතා තිබූ අතර දරුවාට ලැබිය යුතු විශ්‍රාම වැටුප් සහ යැපීම් දීමනා වසර 04 ක සිට ගෙවා නොතිබුණි. | -එම- | විශ්‍රාම වැටුප් සහ යැපීම් දීමනා ප්‍රමාද නොකර අදාළ ප්‍රතිලාභීන් වෙත ගෙවීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | (iii) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| | ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයකු වෙත වැඩිපුර ගෙවා තිබූ රු.207,975 ක ජීවන වියදම් දීමනාව ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාරික ලෙස අය කර ගැනීමට වාරික ගණන තීරණය කර දෙන මෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව දන්වා ඇත. | වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකරගැනීමට කටයුතු කල යුතු වේ. |
| | (iv) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | |
| | • 14/2019 අයවැය යෝජනා අනුව විශ්‍රාමකයින්ගේ හා වැන්දඹු අනත්දරු ප්‍රතිලාභීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කළ යුතු වුවත්, හැඳුනුම්පත් නොමැතිවීම හා ලිපිගොනුවල තොරතුරු නොමැති වීම යන හේතූන් මත විශ්‍රාම වැටුප්ලාභීන් 30 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කර නොතිබුණි. | විශ්‍රාමකයින් දැනුවත් කර ඇති බව දන්වා ඇත. | විශ්‍රාම වැටුප් අප්‍රමාදව සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| | • විශ්‍රාමකයින් මිය ගිය බව නොදැන ඔවුන්ගේ විශ්‍රාම වැටුප බැංකු වෙත යැවීම නිසා, පුද්ගලයින් 04 දෙනෙකු වෙනුවෙන් ගෙවීම් කල රු.193,136 ක් 2021 මැයි 11 දින වන විටත් අදාල බැංකු වලින් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වගකීම් විරහිතව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | බැංකු දැනුවත් කර ඇත. නමුත් බැංකුවේ ණය වාරික විශ්‍රාම වැටුපෙන් අය කර ඇති බැවින් මුදල් එවීම ප්‍රමාද වී ඇති බව දන්වා ඇත. | විශ්‍රාමිකයින් මිය ගිය බව නොදැන්වීමට අදාල නිලධාරින් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුතු අතර රජයට සිදු වූ පාඩුව ද අයකර ගත යුතුවේ. |
| (උ) | දිඹුලාගල, ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත හා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ස්ථාන මාරු ලද නිලධාරීන් 23 ගේ ලිපිගොනු ගෙන්වා ගෙන නොතිබීම හේතුවෙන් වැටුප් සංශෝධනය කිරීම හා වැටුප් වර්ධක ලබාදීම සිදුකර නොතිබුණි. | පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කර එවන බව දන්වා ඇතත් එම ලිපිගොනු ලැබී නොමැති බව දන්වා ඇත. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි නිලධාරීන් විසින් එකතුව රු.2,428,067 ක මූල්‍ය වංචා සිදුකර තිබුණු අතර, ඔවුන් විසින් පළමු උප ලේඛණයට ගැනෙන එම වංචාවන් සිදුකර ඇති බව විනය පරීක්ෂණ වාර්තා අනුව පිළිගෙන තිබුණි. එහෙත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එම නිලධාරීන් දෙවන උපලේඛනයට ගැනෙන වරදක් සිදුකර තිබූ බවට නිගමනය කරමින් නැවත සේවයේ පිහිටුවා තිබුණු අතර, සිදුවී ඇති අලාභය අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | විනය බලධාරියාගේ අවසන් තීරණයට යටත්ව මෙම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවා ඇත. අලාභය අයකිරීම ගැන සඳහන් නොවන බව දන්වා ඇත. | රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනය හා දෙවන උපලේඛනයට ගැනෙන මූල්‍ය වංචා අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (එ) | වන අලි හානි වන්දි මුදල් ගෙවීමේදී, වනජීවී කාර්යාලයෙන් වාර්තා ඉදිරිපත් වීම ප්‍රමාද වීම, ග්‍රාම නිලධාරීන් විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම, ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හා ප්‍රතිපාදන ලැබීම ප්‍රමාදවීම යන හේතු මත පුද්ගලයින් 71 දෙනෙකුගේ දේපළ වලට සිදු වී තිබූ වන අලි හානි සඳහා වන්දි මුදල් ගෙවීම සිදුකර නොතිබුණි. | පිළිගෙන ඇත. | වන අලි හානි සඳහා වන්දි ගෙවීම කඩිනම් කළ යුතු වීම. |
| (ඒ) | මැදිරිගිරිය, තමන්කඩුව, ඇලහැර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වල මධ්‍යම රජයට අයත් ඉඩම් හිමි පුද්ගලයින් 44 දෙනෙකුගෙන් ලැබිය යුතු හිඟ බදු ආදායම රු. 7,533,660 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බදුකර අවලංගු කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත උපදෙස් ඉල්ලා ඇත.<br>හිඟුරක්ගොඩ, තමන්කඩුව හා ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් බදු මුදල් අය කර ගැනීමට නිලධාරීන් දැනුවත් කර ඇති අතර බදු සහන ලබා ගැනීමට හැකියාව විමසා ඇති බව දන්වා ඇත. | හිඟ බදු මුදල් නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | 2017 හා 2019 වර්ෂ වල පිබිදෙමු පොළොන්නරුව මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයෙන් අත්පත් කර ගත් ඉඩම් හෙක්ටයාර 1.6564 ක කැබිලි 67 ක් සඳහා යාවත්කාලීනව අවශ්‍ය ක්‍රියාකාරකම් ඉටු නොවීම නිසා අදාල ඉඩම් හිමියන්ට වන්දි ගෙවා නොතිබුණි. මේ හේතුවෙන් ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රමාදවන කාලයට අනාගතයේදී වාර්ෂිකව සියයට 7 ක පොලියක්ද සමඟ ගෙවීමට සිදුවීමෙන් රජයට අමතර වැය බරක් දැරීමට සිදුවිය හැක. | වන්දි ගෙවීම් ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගත වන අතර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු කිරීම මගින් රජයට සිදුවන අලාභය අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඕ) | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති හා රාජ්‍ය ආයතන ඉදිකිරීම් කටයුතු සඳහා 1984 -2011 කාල සීමා තුල අත්පත් කරගත් ඉඩම් හෙක්ටයාර 0.97 ක් සඳහා යාවත්කාලීනව ක්‍රියාකාරකම් ඉටු නොවීම නිසා අදාල ඉඩම් හිමියන්ට වන්දි ගෙවා නොතිබුණි. ඒ හේතුවෙන් ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රමාද වන කාලයට වාර්ෂිකව සියයට 7ක පොලියක්ද සමඟ ගෙවීමට සිදුවීමෙන් රජයට අමතර වැය බරක් දැරීමට සිදුවන අතරම ඉඩම් හිමියන්ට තම ජීවිත කාලය තුල වන්දි ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ගුවන් හමුදාව විසින් හදිසි අවශ්‍යතාවයන් මත ඉඩම් එළිපෙහෙලි කිරීම හේතුවෙන් මායිම් සොයා ගැනීමට නොහැකිවීම මත මෙම තත්වය සිදුවී ඇති බව දන්වා ඇත. | කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු කිරීම මගින් රජයට සිදුවන අලාභය අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ |
| (ක) | ලංකාපුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කර තිබූ ඇගලුම් ආශ්‍රිත කුඩා කර්මාන්ත සංවර්ධන වැඩසටහන අසාර්ථක වීම නිසා එම කර්මාන්ත ශාලාවලින් ඉවත්කර තිබූ අයිතම 15 ක් හා උපකරණ තොගයක් වසර 02 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | අදාළ කර්මාන්තය ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | ඵලදායීව උපයෝජනය සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

(ග) ගොඩනැගිලි භාවිතය

| | | |
|---|---|---|
| (i) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල සකස් කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විධිමත් අනුමැතියකින් තොරව ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් රජයේ නිවාසයක් කඩා ඉවත් කර තිබූ අතර, එම නිළ නිවස වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.142,510 ක් ගෙවීම් කර නොතිබුණි. | අනුමැතිය ලබා දෙන මෙන් ලිඛිතව ඉල්ලීම් කර ඇති බව දන්වා ඇත. | නියමිත අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගොඩනැගිලි ඉවත් කිරීම සිදු කල යුතු අතර ගෙවීම් සම්බන්ධව නිවාස සංවර්ධන අධිකාරිය විමසා නිරවුල් කරගත යුතු වේ. |
| (ii) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ iii ශ්‍රේණියට අයත් මුරකරු නිල නිවාසයේ 2016/2/18 සිට 2018/3/15 දක්වා ගෙවිය යුතු රු.55,165 ක ජල බිල්පත් ගාස්තු අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඔහුගේ වැටුපෙන් අයකර එවන ලෙස එම නිලධාරියා දැනට සේවය කරන දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | අදාළ නිලධාරියාගෙන් අය කර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (iii) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා පියස් 13 ක් 2019 වර්ෂයේ සිට කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් සඳහා වෙන්කර තිබූ අතර එම ඉඩ ප්‍රමාණයන්, භාවිතා නොකිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍ය කාර්යාලීය උපකරණ ලැබී නොමැති බැවින් සේවා පියස් භාවිතයට ගත නොහැකි බව දන්වා ඇත. | වත්කම් නිසි පරිදි උපයෝජනය කළ යුතු වේ. |
| (iv) විශ්‍රාම ගොස් ඇති කාර්මික නිලධාරියකු ගිවිසුම්ගත කාලය ඉක්මවා වසර 32 ක් තිස්සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිළ නිවාසයක පදිංචි වීම නිසා අයවිය යුතු දණ්ඩන කුලිය රු.242,310 ක් අයකර ගැනීමට හා නිවාස සන්තකය නැවත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | සන්තක අයිතිය පවරා ගැනීම සඳහා නඩු පැවරීම සිදුකර සන්තක අයිතය පවරා ගැනීමට නියෝග ලබාගන්නා ලද බව දන්වා ඇත. | නිවාස සන්තකය නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා ගැනීමට හා දණ්ඩන කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (v) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසයක 2014 වර්ෂයේ සිට 2020 මැයි දක්වා මෝටර් රථ පරීක්ෂකවරුන් පදිංචි වී සිටි අතර ඔවුන්ගෙන් අය කළ යුතු හිඟ කුලිය හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්තමානයේ පදිංචි වී සිටින මෝටර් රථ පරීක්ෂකවරයෙකුගෙන් කුලිය අයවන බව. | පැරණි හිඟ කුලිය හඳුනාගෙන අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (vi) පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ රු. 36,807,189 ක් වැයකර ඉදිකර තිබූ මින්නේරිය බස් නැවතුම්පල 2019 නොවැම්බර් 05 වන දින හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබූ අතර එහි ඉහල මහල වසර එකහමාරකට වැඩි කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි. | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කටයුතු සිදු කරන අතර කඩ කාමර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇත. | රජයේ මුදල් වැයකර ඉදිකර තිබෙන වත්කම් කාර්යක්ෂම අන්දමින් උපයෝජනයට ගත යුතු වේ. |
| (vii) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක කොටසක් මහජන බැංකුවේ ශාඛාවක් පවත්වාගෙන යාම වෙනුවෙන් 1998 මැයි 30 දින සිට ඉදිරියට අවුරුදු 03ක කාලයක් සඳහා කුලී පදනමට ලබාදී තිබූ නමුත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම දීර්ඝ කර නොතිබුණි. 2010 අගෝස්තු මාසයේ සිට 2020 දෙසැම්බර් දක්වා වසර 10 කට අධික කාලයක සිට මාසිකව රු.4,000 බැගින් වූ තක්ස්රු කුලියක් අයකර ගනිමින් තිබූ අතර, 2019 ඔක්තෝබර් මාසයේ සිට රු.15,000 ක් ලෙස එය නැවත තක්සේරු කර තිබුණද, එම කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 15,000 ක තක්සේරු මුදලට ගිවිසුම්ගතවීම සඳහා ගිවිසුම්පත් මහජන බැංකු වෙත භාරදී ඇති බව දන්වා ඇත. | කාලානුරූපීව ගිවිසුම් දීර්ඝ කිරීමට හා තක්සේරු කරන ලද කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 4. යහපාලනය

## 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 6/2020 දරන හා 2020 පෙබරවාරි 20 දිනැති චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව නිර්ණායක 10 ක් පදනම් කරගෙන ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සම්මුඛ පරීක්ෂණ පවත්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට බහුකාර්ය සංවර්ධන සහයකයින් ලෙස බඳවා ගෙන තිබුණි. නමුත් වසම්වල වැඩි ලකුණුලාභීන් සිටියදී ඉතාමත් අඩුම මට්ටමේ ලකුණු ලබාගත් අයදුම්කරුවන් හා ලකුණු බිංදුව සහිත අයදුම් කරුවන් තෝරාගෙන තිබීම නිසා බඳවා ගැනීම් විධිමත්ව සිදු වී නොතිබුණි. | පත්වීම් ලබා දීම් හා තෝරා ගැනිමේ කටයුතු බහු කාර්යය සංවර්ධන කාර්ය බලකා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද බව දන්වා ඇත. | රජයේ රැකියා ලක්ෂය ලබාදීමේ වැඩසටහනේ මූලික අරමුණු ඉටුවන ආකාරයෙන් විනිවිද භාවයකින් කටයුතු සිදු කළ යුතු වේ. |
| (ආ) බහුකාර්ය සංවර්ධන සහයකයින් බඳවා ගැනීමේදී එහි අරමුණු නොසලකා හරිමින් අඩු ආදායම් මට්ටම් සැලකිල්ලට ගෙන නොතිබුණි. ඒ අනුව අවිවාහක, පවුලේ අයෙකු රජයේ හෝ අර්ධ රාජ්‍ය රැකියා නියුතු සහ කුඹුරු ඉඩම් හිමි, විදේශ රැකියා නියුතු, වාහන වැනි දේපල හිමි පවුල් වෙත ද බහුකාර්ය සංවර්ධන සහයකයින් ලෙස රැකියා ලබාදී තිබූ බව ග්‍රාම නිලධාරි මඟින් හා වසම් වලට ගොස් තහවුරු කරගත් තොරතුරු හා සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව නිරීක්ෂණය විය. | අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ වලට භාජනය කර දිළිඳු බවේ අනුපිළිවෙලට ලැයිස්තුගත කර බහු කාර්යය සංවර්ධන කාර්ය බලකා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර පත්වීම් ලබා දීම් හා තෝරා ගැනිම එම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද බව දන්වා ඇත. | විනිවිද භාවයකින් යුතුව ඉතා සුදුසුම පුද්ගලයින් සඳහා පත්වීම් ලබාදිය යුතු වේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 12 ක් ද අනෙකුත් කාර්යමණ්ඩලය පුරප්පාඩු 227 ක් ද, පැවතුණි. | පිළිගෙන ඇත. | අවශ්‍යතාවය මත කාර්යමණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුයි. |